# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: 06/2016

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 සැප්තැම්බර් මස 22වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>සහනදායී පදනම මත මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම</u>**

2011/01/06 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක: 01/2011 සහ 2016/07/14 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක: 01/2016 හි 01 ඡේදයේ 1.7 උප ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

ඉහත කී පරිදි 1.7 ඡේදයෙහි සඳහන් " ජ්‍යෙෂ්ඨ මට්ටම" හි නිර්ණය පහත පරිදි විය යුතුය.

අ) කථිකාචාර්ය ( තනතුරෙහි ස්ථිර කරන ලද) සහ ඉහළ තනතුරක් දරන ආචාර්යවරයෙකු " ජ්‍යෙෂ්ඨ මට්ටම" ලෙස සැළකිය හැකි අතර වසර අටක (08) ක සේවා කාලය ගණන් බැලීමේ දී කථිකාචාර්ය ( ආධුනික) සහ ඉහළ තනතුරුවල සිදු කළ සේවය සැලකිල්ලට ගනු ලැබේ.

ආ) අනධ්‍යයන විධායක කාර්ය මණ්ඩලයෙහි " ජ්‍යෙෂ්ඨ මට්ටම", 2011/01/06 දිනැති විශ්වවිද්‍යාල කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපි අංක: 01/2011 හි සඳහන් පරිදි 2006/04/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි ඇමුණුම II හි 3.10 සහ 3.11 කොටස් සමඟ කියවිය යුතු 2(IV) ඡේදයේ අර්ථ විග්‍රහය ප්‍රකාරව වර්ගීකරණය කළ හැකිය.

කරුණාකර ඉහත උපදෙස් හා අනුකූලව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා

සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසී/එච්ආර්/6/2/34(ඒ)